**සීමාසහිත මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම -2017/2018**

සීමා සහිත මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමේ 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු ප්‍රකාශනය සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව වර්ෂය තුළ ගෙවන ලද පාරිතෝෂික රු.1,602,222ක් ලෙස තිබුණද ඉදිරිපත් කරන ලද ගෙවීම් උපලේඛනය අනුව ශේෂය රු.1,295,083ක් වූයෙන් රු.307,139ක වෙනසක් නිරීක්ෂණය විය. තවද සමාලෝචිත වර්ෂයේ ගෙවූ පොලී රු.60,380 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

(ආ) සමාගම විසින් රු. 19,897,953 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ඉදිරිපත් කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයේ 2017 අප්‍රේල් 01 දිනට පැවති ශේෂ සහ සමාලෝචිත වර්ෂයේ ගනුදෙනු පමණක් සටහන් කර ඇති තිබුණ ද එක් එක් වත්කම් මිලදී ගත් දිනයන් සඳහන් නොතිබුණි. එබැවින් 2018 මාර්තු 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති වත්කම් හඳුනාගැනීමට නොහැකි වූ අතර වත්කම්වල ලියාහල අගයෙහි නිවැරදිතාව පිළිබඳවද තහවුරු නොවීය.

(ඇ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව බාණ්ඩ 08 ක් යටතේ වූ පිරිමි හා ගැහැනු ලෙස වර්ගීකරණය කරන ලද අභිජනනය කල මවුසතුන් (Breeder stock) 17,720 ක ගේ අගය භෞතිකව සත්‍යාපනය කිරීමෙන් තොරව රු 20,179,278 ක් වූ පොත් අගය මූල්‍ය ප්‍රකාශනයට ගෙන තිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති තොගයෙහි නිරවද්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේ දී තහවුරුවක් ගැනීමට නොහැකි විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් 2016 වසරේ සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එන භාවිතයට ගත නොහැකි තොගය තුළ රු. 124,946 වූ මිශ්‍ර ආහාර (mixed feed) සහ රු. 141,337 වූ අනෙකුත් තොග (Other stock) ඇතුළත් වී ඇති බැවින් තොග අධි ගණනයක් සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

(ඉ) රසායනික ද්‍රව්‍ය (Drugs) වර්ග 26 ක් 2016 වර්ෂයේ සිට නැවත භාවිතයට ගත නොහැකි ලෙස (condemned) හඳුනාගෙන තිබූ අතර 2018 වර්ෂයේ සමාගමේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙහිද එලෙසම පැවතුණු අතර මෙම තොගයන්හි වටිනාකම් විගණනයට ඉදිරිපත් නොවූ අතර මෙම තොග අවසන් තොගය තුල ඇතුලත්ද නැතහොත් ලියා හැර ඇත්ද යන්න තහවුරු කර ගැනිමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය

(ඊ) සමාගමේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව නැවත භාවිතයට ගත නොහැකි ලෙස අබලන් වූ (condemned) ඉන්වෙන්ට්‍රි අයිතම 577 ක් වූ වත්කම් වල වටිනාකම් විගණනයට ඉදිරිපත් නොවුණි. මෙම වත්කම්වල වටිනාකම් තව දුරටත් ස්ථාවර වත්කම් තුළ ඇතුළත්ද නැතහොත් ලියා හැර ඇත්ද යන්න තහවුරු කර ගැනිමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(උ) සැකසුම් අංශයේ ශීත කාමරයෙහි (processing unit –cool room) අයිතම 14 ක භෞතික ශේෂය භාණ්ඩ සමීක්ෂණ වාර්තා වලට ඇතුලත් නොකර බින් කාඩ් වල සඳහන් 9,226 kg ක් පමණක් ඇතුලත් කර තිබුණි. මෙම තොගයන්හි වටිනාකම් විගණනයට ඉදිරිපත් නොවූ අතර මෙම තොග අවසන් තොගය තුල ඇතුලත්ද යන්න තහවුරු කර ගැනිමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය .

(ඌ) සමාගම විසින් 2018 මූල්‍ය වර්ෂය සඳහා ලෙජරයන් ගිණුම්කරණ පද්ධතිය හරහා සැකසීමේ දී තොග සමීක්ෂණ වාර්තාවේ අගයන් (ප්‍රමාණයන්) පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අවම අගයට අගය කර ප්‍රති ආගණනය (rollback) කිරීමක් 2020 අගෝස්තු 18 දින දක්වා සිදුකර නොතිබුණි. ලෙජරය තුල වූ තොගය, තොග සමීක්ෂණ වාර්තාවන් අනුව යාවත්කාලීන කිරීමක් සිදු නොකර ලෙජරයෙහි අගයන් එලෙසම පවත්වාගෙන යාම හේතුවෙන් රු.36,174,595 ක් වූ තොගය අධි ගණනයක් හෝ ඌණ ගණනයක් සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

(එ) සමාගමේ මූල්‍ය වර්ෂය සඳහා වූ ලෙජරය තුළ ඌරන්,පොල් ගස් ආදිය සඳහා ජීව විද්‍යාත්මක වත්කම් වශයෙන් ලෙජර කාණ්ඩ හඳුන්වා දී නොතිබීම හේතුවෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 41ට අනුව මූල්‍ය ප්‍රකශනයෙහි වෙනම අයිතමයක් ලෙස ජීව විද්‍යාත්මක වත්කම් ඉදිරිපත් කළ නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඒ) රු.69,183,019ක් වන වෙළඳ ලැබිය යුතු ශේෂය තුළ ඇතුළත් ශේෂ 9 කට අදාල එකතුව රු.36,688,851 ක විස්තර, එනම් සියයට 53 ක වටිනාකමකට අදාල කාල විශ්ලේෂණය, උප ලේඛන කිසිවක් ඉදිරිපත් නොකළ අතර එම ශේෂ දීර්ඝ කාලයක සිට පැවත ඒන අතර නැවත අයකර ගත නොහැකි වීමේ අවදානමක් නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 හි 63 ඡේදය ප්‍රකාරව, මෙම වත්කම් හානිකරණය කිරීමක් සිදු නොවීම නිසා මෙම වත්කමේ වටිනාකම අධි ගණනය වේ.

(ඔ) සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන අනුව සමස්ත ආදායම රු.171,804,248ක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව ආදායම රු.168,226,004ක් වූයෙන් රු.3,578,244ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව වර්ෂය තුළ රු.11,507,543ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇතත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා ඇත්තේ රු.11,092,044ක් බැවින් රු.415,499ක වෙනසක් විය.

(ඖ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වල තොගය වැඩිවීම රු.2,768,920ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව වටිනාකම රු.1,905,598ක් වූයෙන් රු.863,322ක වෙනසක් විය.

(ක) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ගෙවිය යුතු එකතුකල අගය මත බදු වටිනාකම රු.702,835ක් වූ අතර එකතුකල අගය මත බදු වාර්තාව අනුව ගෙවිය යුතු බදු වටිනාකම රු.2,312,330ක් වූයෙන් රු.1,609,495ක වෙනසක් විය.

(කා) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ගෙවිය යුතු ආදායම් බදු වටිනාකම රු.27,157,943ක් වුවද උප ලේඛන අනුව වටිනාකම රු.27,352,328ක් වූයෙන් රු.194,385ක වෙනසක් විය.

(කැ) අනෙකුත් ගෙවිය යුතු බදු සහ අනෙකුත් ගෙවිය යුතු ශේෂයන්ගේ ආරම්භක ශේෂ වටිනාකම් සම්බන්ධයෙන් ලෙජරය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව පිළිවෙලින් රු. 165,311 ක හා 145,358 ක වෙනසක් නිරීක්ෂණය විය.

(කි) ලාභ හෝ පාඩු ප්‍රකාශන අනුව පොලී ආදායම රු.3,413,555 ක් වුවද ඉදිරිපත්කර ඇති උපලේඛන අනුව පොලී ආදායම රු.3,156,025 වූයෙන් රු.257,530 ක වෙනසක් නිරීක්ෂණය විය.

(කෑ) වර්ෂය තුළ ස්ථාවර තැන්පතු පොලිය ලෙස රු.2,180,338ක් ලැබී ඇතත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි එම අගය රු.4,356,874ක් බැවින් රු.2,176,536ක වෙනසක් විය.

(කී) රු. 2,136,334 ක් වූ ගෙවිය යුතු ජාතික ගොඩනැගීමේ බදු, රු. 10,630,937 ක් වූ වෙළඳ හා ලැබිය යුතු දෑ සඳහා අඩමාන ණය, රු.931, 767 ක් වූ ආර්ථික සේවා ගාස්තු හා රඳවා ගැනීමේ බදු, රු. 2,370,190 ක් වූ විලම්බිත බදු, රු. 1,314,491 ක් වූ ගෙවිය යුතු ආදායම් බදු සහ රු.702,835 ක් වූ ගෙවිය යුතු එකතු කළ අගය මත බදු සඳහා ගණනය කිරීමේ ලේඛන ද, රු.105,245,935 ක් වූ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ සඳහා විස්තරාත්මක උපලේඛන ද, රු.36,688,851 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ සඳහා කාල විශ්ලේෂණය ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ මතය ව්‍යාචනය සඳහා පදනම ජේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් නියමකරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම, විෂය පථය සහ විගණනයේ සීමාවන් ඉහත දක්වා ඇත.

(ආ) මෙම වාර්ථාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ගෙවිය යුතු රු.995, 230ක ණය මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 05ක් ඉක්මවා ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් සටහන් අංක 07 - වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ සටහන තුල ඇතුලත් රු.36,688,851ක ශේෂයන් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන අතර එම ශේෂයන් අයකර ගැනීමට සමාගම අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) 2016 වර්ෂයේ සිට පැවත එන රු.1,970,378ක් වූ ගෙවිය යුතු ලාභාංශ බදු වටිනාකම මේ දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2017/ 2018 වර්ෂය අවසන් ගිණුමේ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂය තුළ වසර 2 ට වඩා පැරණි රු.1,970,413 ක් හා වසර 1-2 අතර පැවති ශේෂය රු.47,952,704ක් විය.

(ඊ) වෙළඳ ගෙවිය යුතු දෑ ශේෂය වන රු.80,890,415 ක් වූ වටිනාකම තුල ඇතුලත් එකතුව රු. 31,633,183 ක ශේෂ වටිනාකම් 2017 වර්ෂයේ සිට නිරවුල් නොවී පැවති අතර එය මුළු වෙළඳ ගෙවිය යුතු දෑ ශේෂයෙන් 39% ක් වන බව නිරීක්ෂණය විය.

(උ) 2017 වර්ෂයේ සිට පැවත එන රු.15,497,840 ක අවිනිශ්චිත ණයහිමි ශේෂයක්, සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබූ අතර, එම ශේෂය වෙනත් ගෙවිය යුතු දෑ ශේෂයෙන් 78% ක් වන බව නිරීක්ෂණය විය.

(ඌ) විවිධ ණයහිමි ශේෂය වන රු.827,827 ක් වූ වටිනාකම 2017 වර්ෂයේ සිට නිරවුල් නොවී එලෙසම පැවති බව නිරීක්ෂණය විය.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | **නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | 1978 අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | සාංගම ව්‍යවස්ථාවලිය 69 ඡේදය | සාංගමික ව්‍යවස්ථාවලිය අනුව මහ සභා රැස්වීමේදී මෙම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම කළ යුතු වුවත් ඊට පටහැනිව අමාත්‍යවරයා විසින් සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය පත් කර ඇති බව නිරීක්ෂණය විය. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,447,304 ක අතිරික්තයක් වූ අතර ,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.26,359,133ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.18,911,829 ක පිරිහීමක් විය.ඉකුත් වර්ෂයට සාපේක්ෂව විකුණුම් ආදායම රු.4,532,885 කින් එනම් සියයට 2.5 කින් අඩු වූ අතර විකුණුම් පිරිවැය රු.18,001,351 කින් එනම් සියයට 14.8 කින් වර්ධනය වි තිබුනි. ඒ අනුව දළ ලාභය රු.22,534,236 කින් අඩු වීම හා පරිපාලන වියදම් රු.1,184,289 කින් වැඩි වීම ඉහත පිරිහීමට ප්‍රධාන ලෙස බලපා තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 148 ඡේදය ප්‍රකාරව සමාගමෙහි ශුද්ධ වත්කම සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකට වඩා අඩු බවත් ඒ අනුව සමාගමෙහි තදබල ප්‍රාග්ධන පාඩු තත්වය මේ දක්වා මගහැරී නොමැති බවත් නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

**(අ) හුරුගස්වැව ගොවිපල**

(i) මෙම ඉඩම මහවැලි සත්ව ව්‍යාපාරික සමාගමට අයත් නොවන අතර බදු ගිවිසුමක් ද නොතිබූ අතර ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) මෙම ඉඩමේ භූමි ප්‍රමාණය නිශ්චය වශයෙන් මෙතෙක් හඳුනාගෙන නොමැති බැවින් නිෂ්කාර්යව පවතින භූමි ප්‍රමාණය නිශ්චිතව හඳුනා ගත නොහැකි බව නිරීක්ෂණය විය.

(iii) සමාගම විසින් භාවිතා කරනු ලබන ඉඩමේ පිහිටි ගබඩා දෙක MLE/B21 හා MLE/B24 ලෙස නම්කර ඇති අතර, එම ගබඩාව තුල කුකුලු කෑම ඇඹරුම් යන්ත්‍රය ස්ථාපිත කර ඇති අතර ඊට අමතරව එම ගබඩාව තුල වටිනාකම තක්සේරු කර නොමැති අයිතමයන් අනාරක්ෂිතව ඇති බව නිරීක්ෂණය විය.

**(ආ) කලංකුට්ටිය ගොවිපල**

මෙම ඉඩම සඳහා 2010 සිට 2018 දක්වා වර්ෂ නවයක් සඳහා අධිභාර ඇතුළුව රු. 10,485,000 මුදලක් ගෙවීමට ඇති බවත් එම බදු මුදල් ගෙවා නොමැති බැවින් බදු අයිතිය අවලංගු කරන බවට RPM/T/L/CLO/ගල්/74 අංක හා 2017 ඔක්තෝබර් 10 දිනැති ලිපිය මගින් මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකාර (එච් කලාපය) විසින් දන්වා තිබූ අතර බදු සඳහා ගෙවීම් කිරීමට බදු ගිවිසුමකට එළඹ ඇති බවට වාර්තා සොයාගත නොහැකි වී තිබුණි.

**(ඇ) කාර්යාලය පිහිටි ගොවිපල**

අක්කර 26කින් යුතු මෙම ඉඩම මහවැලි අධිකාරියට අයත් වන අතර ඉඩම සම්බන්ධයෙන් 1989 ඔක්තෝබර් 03 දින තිස් අවුරුදු බදු ගිවිසුමකට එළඹ ඇති අතර එහි කොන්දේසි වලට අනුකූලව 2019 වර්ෂයේ ඔක්තෝබර් 02 දින දී බදු කාල සීමාව අවසන් වී ඇති බව නිරීක්ෂණය විය. තවද, එකතුව වර්ග අඩි 31,099 ක ගොඩනැගිලි හා වර්ග අඩි 46,924 ක ව්‍යුහයන්ගේ වටිනාකමක් ඇති ඉදිකිරීම් සිදුකර ඇති (වටිනාකම නොමැත) මෙම ඉඩමට අදාල ගිවිසුම් යාවත්කාලීන කිරීමට ක්‍රියා කර නොතිබුණි. අංක අමප/15/0940/631/018-I හා 2015 ජූලි 16 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ දක්වා ඇති පරිදි අංක BD/RDS/124/CM/07 හා 2015 ජූලි 08 දිනැති මුදල් අමාත්‍යාංශ නිරීක්ෂණය අනුව අදාල නිතිමය පරිපාටි යටතේ සමාගමේ මෙහෙයුම් කාර්යක්ෂමතාව තහවුරු කිරීම් සඳහා සියලු සම්පත්,වත්කම්,කොටස් සහ කළමණාකාරීත්වය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මගින් ලබාගත යුතු අතර 2017 වර්ෂය තුළ සමාගමේ කොටස් අයිතියෙන් සීයයට 27ක් පමණක් අත්කරගෙන තිබුණි. එසේ වුවද මේ දක්වා අත්පත් කර ගැනීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

#### 4.1.1 සැලැසුම් කිරීම

(අ) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව සමාගම විසින් ඉටු කළ යුතු නමුත් පහත සඳහන් කාර්යයන් සමාගම විසින් වර්තමානයේ ඉටු කරනු නොලබයි.

- කුකුළු ආහාර විකිණීම
- ගවයින්සජීවි හා අජීවි කොටස් විකිණීමට,අභිජනනය,ආනයනය,අපනයනය,සැකසීම හා ගණුදෙනු කිරිම.

- බටර්,චීස්,අයිස්ක්‍රීම්, විකිණීමට ආනයනය , අපනයනය, සැකසීම හා ගණුදෙනු කිරීම.
- ධාන්‍ය නිෂ්පාදනය හා ධාන්‍ය වර්ග,පලතුරු හා පිටි තොග හා සිල්ලරට විකිණීම.

**(ආ) සංයුක්ත සැලැස්ම 2017/2018**

2003 ජුනි යහපාලන පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 12 හා 2014 පෙබරවාරි 11 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට කලින් පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් පසු, රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබඳ දෙපාර්තුමේන්තුව,මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කළයුතු නමුත් සංයුක්ත සැලැස්ම විගණිත දිනය වන 2022 මාර්තු 25 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) ක්‍රියාකාරී සැලැස්ම 2017/2018**

(i) මෙම සමාගමේ මුදල් වර්ෂය අප්‍රේල් 01 සිට මාර්තු 31 දින වන අතර 01/2014 අංක දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) ඡේදය ප්‍රකාරව ව්‍යාපෘති සැලැස්ම පදනම් කර ගෙන ඉදිරි මුදල් වර්ෂයේදී එනම් 2017 අප්‍රේල් මස 01 දින සිට 2018 මාර්තු 31 වන දින දක්වා වූ මුදල් වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතු නමුත් විගණනයට ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම 2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණි.

(ii) එසේ පිළියෙල කර විගණනයට ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොමැති අතර එහි අන්තර්ගත විය යුතු පහත කරුණු ඇතුළත් වී නොතිබුණි.

a) වාර්ෂික අයවැය ලේඛනයේ ඇතුළත් විය යුතු මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය
b) මානව සම්පත් සංවර්ධන සැලැස්ම
c) අභ්‍යන්තර විගණන සැලැස්ම
d) යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය සහ දැනට සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තරය

(iii) 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ සමාගම තුළ ක්‍රියාත්මකවන එක් එක් ව්‍යාපෘති හා ඒ යටතේ ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන සැලසුම් කර නොමැති අතර සැලසුම් කර ඇති ක්‍රියාකාරකම්වලට ද භෞතික ඉලක්කයන් සඳහන් කර නොමැති බව නිරීක්ෂණය විය.

(iv) සමාගම තුල ක්‍රියාත්මක කරන පොල් වගාව සහ බඩ ඉරිඟු වගාව පිළිබඳ තොරතුරු 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් නොවූ බව නිරීක්ෂණය විය.

**(ඇ) කාර්යසාධන වාර්තාව 2017/ 2018**

2017 අප්‍රේල් මස 01 දින සිට 2018 මාර්තු 31 වන දින දක්වා වූ මුදල් වර්ෂ සඳහා කාර්යයසාධන වාර්තාව පිළියෙල කල යුතු නමුත් විගණනයට ඉදිරිපත් කරන ලද කාර්යයසාධන වාර්තාව 2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දිනට අදාළව පිළියෙල කර තිබූ අතර ඒ සම්බන්ධ පහත සඳහන් දෑ නිරීක්ෂණය විය.

(i) 2018 වර්ෂය සඳහා සමාගම විසින් කාර්යය සාධන වාර්තාව පිළියෙල කර ඇත්තේ කුකුළු ව්‍යාපාතියට අදාළ භෞතික ප්‍රගතිය පමණක් වන අතර , සමාගම සතු ඌරු ව්‍යාපෘතිය, ගොවිපලේ කෘෂි වගාවන්, අනෙකුත් වගාවන් හා ඉදිකිරීම් ආදීයේ ප්‍රගතියන්ද ඇතුලත්ව සමස්ත ආයතනයට ම පිළියෙල කරන ලද භෞතික හා මූල්‍ය ප්‍රගතිය දැක්වෙන විධිමත් කාර්යයසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

(ii) 2018 වර්ෂයට අදාලව සමාගම විසින් සකස් කර ඇති ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ව්‍යාපෘති හා ඒ යටතේ ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන සැලසුම් කර නොමැති බැවින් කාර්යසාධන වාර්තාවේ දක්වා ඇති එක් එක් පශු සම්පත් ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සමඟ ක්‍රියාකාරි සැලැස්මේ ව්‍යාපෘති හා එකිනෙක සැසඳීමට නොහැකි විය.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

මහවැලි අධිකාරියට අයත් ඉඩම් දෙකක පිහිටා ඇති නිරාවිය කොමර්ෂල් බොයිලර් යුනිට් ගොවිපල හා ග්‍රෝවර් යුනිට් ගොවිපල යන ගොවිපලවල් දෙකේ බොයිලර් කුකුළන් හා මවු සතුන් 20,000 ට වැඩි ප්‍රමාණයක් ඇතිමට කුකුළු කොටු 5ක් ඉදිකර තිබුණි. මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම විසින් මහවැලි අධිකාරිය සමඟ මෙම ඉඩම භාවිතා කිරීම වෙනුවෙන් බදු ගිවිසුමකට එළඹ නොතිබූ අතර අයිතිය නොමැති ඉඩම් වල ඉදි කිරීම් සිදු කර පවත්වා ගෙන යෑම ආයතනයේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධව ගැටළු පැන නැගිය හැකි බව නිරීක්ෂණය විය.

## 4.2 නිෂ්ක්‍රීය හෝ ඌණ උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙහි වාහන 6ක් භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව ඇති බවට දක්වා ඇතත් මූල්‍ය ප්‍රකාශනයන්හි ඉවත්කිරීම් තුළ කිසිදු වටිනාකමක් දක්වා නොමැති බැවින් භාවිතයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. තොරතුරු පහත දැක්වේ.

- Missubishi Canter Freezer Truck JJ 4864
- Samce Tractor with Tayler RB-0578
- Lorry – Isuzu
- Lorry – Hino 42 ශ්‍රී 1471
- Issusu Lorry – 42/0445
- Issusu Frezer Truck – 41-8820

(ආ) දෛනිකව ආහාර ටොන් 3ක් පමණ නිෂ්පාදනය කල හුරිගස්වැව කුකුළු ආහාර නිෂ්පාදන අංගනයේ සවිකර ඇති යන්ත්‍රයක් 2015 වර්ෂය දක්වා ආහාර නිෂ්පාදන කටයුතු සඳහා යොදවා ඇති බවත්, එය 2015 වර්ෂයේ සිට විගණන දිනයවූ 2018 ඔක්තොම්බර් 25 දක්වා නිෂ්කාර්යව පවතින බවත් නිරීක්ෂණය විය.

(ඇ) 2015 ජූලි 08 දිනැති අංක BD/RDS/124/CM/07 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමට අයත් ලොරි රථ 5ක්, මහවැලි අධිකාරියට අයත් සමාගමේ භාවිතය සඳහා ලබා දී තිබූ නමුත් ,2018 ඔක්තෝබර් 25 දක්වා එම වාහන පවරා දී නොතිබුණ අතර අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4.4 ඡේදය ප්‍රකාරව අළුත්වැඩියා කිරීමට ද කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

## 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) 2020 ජුනි 18 දිනැති ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මගින් සමාගම සම්බන්ධයෙන් සිදුකර ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන විමසුම් තුල ,2016 වර්ෂයේ වාර්ෂික තොග සමීක්ෂණ වාර්තාවේ තඹ වයර් රෝල් 05ක් අතිරික්ත තොග අයිතම යටතේ දක්වා තිබූ බවත් 2017 නොවැම්බර් 12 දින අබලි ද්‍රව්‍ය ඉවත්කරන අවස්ථාවේ නිලධාරින් එම තොග සමීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත්කිරීමට අසමත් වූ බවත් දක්වා තිබුණි. 2020 නොවැම්බර් 18 දින කළමණාකාරිණියගෙන් ලබාගත් ලිපිය අනුව එම වයර් තොගයේ බර කිලෝග්‍රෑම් 419.5ක් බව දක්වා තිබූ අතර අන්තර් ජාලයෙන් ලබාගත් තොරතුරු මත 2020 නොවැම්බර් 18 දිනට අනුව එම තොගයේ වටිනාකම රු.251,700 ක් බව නිරීක්ෂණය විය.මේ

සම්බන්ධයෙන් සමාගම 2017 නොවැම්බර් 14 දින පොලිස් පැමිණිල්ලක් කිරීම හැර කිසිදු විමර්ශනයක් සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ඩබල් කැබ් රථයක් සභාපති විසින් භාවිතා කරන බව විගණනය වෙත 2018 ඔක්තෝබර් 22 දින භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. නමුත් එම වාහනය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙන් ලබා ගැනීම සම්බන්ධයෙන් හා සභාපති වෙත අනුයුක්ත කිරීම සම්බන්ධ කිසිදු ලිඛිත ලියවිල්ලක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ හෝ මහවැලි සත්ව ව්‍යාපාරික සමාගමේ හෝ නොතිබුණි.

### 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ කාර්යාලයේ සේවය නියුතු නිලධාරීන් 33 දෙනෙකුට කාර්ය පැවරුම් ලිඛිතව ලබා දී නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 9.2ඡේදය ප්‍රකාරව අනුමත කාර්ය මණ්ඩලයක් සකස් කර මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු අතර එම චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය අනුව සමාගමේ බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටියක් සකස් කර ඒ සඳහාද අදාල අමාත්‍යාංශයේ හා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් ඒ අනුව විගණිත දිනය වන 2022 මාර්තු 10 දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ප්‍රකාරව කාර්ය මණ්ඩලය සඳහා බඳවාගැනීමේ පරිපාටි සකස් කර අනුමත කරවා ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක PED/12 හි 6.5.1 ඡේදය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් තුළ වාර්ෂික ගිණුම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2017/18 මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණේ 2021 දෙසැම්බර් 21 දින වන අතර මාස 43 ක ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

### 5.2 ප්‍රසම්පාදනයන්

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කල යුතු අතර ඉන්පසු එලඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කල යුතුය. එසේ වුවද සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම් ඉදිරිපත් කිරීම | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නියමිත කාල වකවානු තුළ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් නොවීම. |
| (ආ) | ප්‍රසම්පාදන කටයුතු | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු නොකළ අවස්ථා පැවතීම. |

| | | |
|---|---|---|
| (ඇ) | වත්කම් පාලනය | නිසි පරිදි වත්කම් ගිණුම්ගත නොකිරීම, වත්කම් විධිමත් ලෙස පවරා නොගැනීම, වත්කම් නිෂ්කාර්යව පැවතීම හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව කටයුතු නොකිරීම හා උපලේඛන පිළියෙල නොකිරීම. |
| (ඇ) | ලේඛන පවත්වා ගැනීම | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු නොකිරීම. |
| (ඉ) | වාහන පාලනය | තොරතුරු ඇතුළත් කර වාහන ලොග් පොත් සම්පූරණ කර නොතිබීම, වාහන පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදු නොකිරීම, ගොවිපලට ඇතුළු වන හා පිටවන වාහන පිළිබඳ නිසි පරීක්ෂාවක් සිදු නොකිරීම. |
| (ඊ) | ලැබිය යුතු දෑ | ලැබිය යුතු වෙළෙඳ ණය ලබා ගැනීමට කටයුතු නොකිරීම. |
| (උ) | ගෙවිය යුතු දෑ | ගෙවීම් නිසි පරිදි ඉටු කිරීම. |
| (ඌ) | පසු විපරම් කටයුතු | ක්‍රියාකාරී හා සංයුක්ත සැලැස්ම අනුව කාර්ය සාධන වාර්තා පිළියෙල කර පසු විපරම් කටයුතු සිදුකිරීම. |